2

ශ්‍රී ලංකාවේ භූ දර්ශනය



ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ භූ දර්ශනය → භෞතික භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ භූ දර්ශනය → මානුෂ භූ දර්ශනය

භෞතික භූ දර්ශනය

මිනිසාගේ මැදිහත් වීමකින් තොරවල ස්වාභවික පරිසරයේ තිබෙන සංරචක ඇතුලත් භූ දර්ශනය **භෞතික භූ දර්ශනය** නම් වේ.

- භූ විෂමතාව
- ජලවහනය
- දේශගුණය
- වෘක්ෂලතා

මානව භූ දර්ශනය

මිනිසාගේ ක්‍රියාකාරකම් වලින් යුක්තව නිර්මාණය වී තිබෙන භූ දර්ශනය **මානව භූ දර්ශනය** වේ.

- ජනසංඛ්‍යාව
- ජනාවාස
- ආර්ථික ක්‍රියාකාරකම්
- යටිතල පහසුකම්

භූ විෂමතාව

- දීර්ඝ කාලීන භූ කාරක ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා භූමිය සංකීර්ණ වූ විෂමතා ලක්ෂණවලින් යුක්ත වී තිබේ.
- උච්චත්වය (උස) පදනම් කරගෙන ප්‍රධාන භූ විෂමතා කලාප තුනකි.

1. වෙරළබඩ තැනිතලාව (මුහුදු මට්ටමේ සිට මීටර් 30 දක්වා)
2. අභ්‍යන්තර තැනිතලාව (මීටර් 30 සිට මීටර් 300 දක්වා)
3. මධ්‍යම කඳුකරය (මීටර් 300ට වැඩි)



2.1 සිතියම - භූ විෂමතා කලාප

01. වෙරළබඩ තැනිතලාව

- ❖ මුහුදු මට්ටමේ සිට මීටර් 30ක් උස සමෝච්ච රේඛාව දක්වා විහිදෙන ප්‍රදේශයයි.
- ❖ උතුරේ දී කිලෝමීටර් 32ක් පමණ පළල්ව විහිදේ.
- ❖ දකුණු ප්‍රදේශයේ ඇතැම් ස්ථානවල කිලෝමීටර් 3ක් පමණ පටු වේ.
    - ➢ ගංගා නිම්නවල පහළ කොටස් හා මෝය ප්‍රදේශ
    - ➢ තැනිතලා බිම්
    - ➢ තුඩු
    - ➢ කලපු
    - ➢ වැලිතලා
    - ➢ හැඩපලු ගංගා
    - ➢ වගුරු බිම්
    - ➢ ඩෙල්ටා මේ කලාපයට අයත් ය.

වගුරු බිම් - ගංගා මෝය ප්‍රදේශ වැලි තැන්පත් වී ඇහිරීම නිසාත්, ගංගා පිටාර ගැලීම හේතු කොටගෙන පහත් බිම්වල ජලය රැඳීම නිසාත් වගුරු බිම් නිර්මාණය වේ.

නිදසුන්:- මුතුරාජවෙල, බූන්දල, කලමැටිය, සෝමාවතිය, ආනවිලුන්දාව, කිරල කැලේ

බොකු - මුහුදට විවෘත වූ කොටස විශාල වූ, ගොඩබිම දෙසට නෙරාගිය කරදිය පිරුණු මුහුදු ප්‍රදේශ බොකු ලෙස හැඳින්වේ. මෙවැනි බොකු රාශියක් දිවයින වටා පිහිටා ඇත.

නිදසුන්:- කොඩ්ඩියාර් බොක්ක, ආරුගම් බොක්ක, වැලිගම බොක්ක

කලපු - වැලිපරයක් සහිත, පටු විවරයකින් මුහුද හා සම්බන්ධ වන කිවුල් දිය පිරුණු, නොගැඹුරු, දිගැටි ජලාශ කලපු ලෙස හැඳින්වේ.

නිදසුන්:- මීගමුව කලපුව, යාපන කලපුව, පුත්තලම කලපුව, හලාවත කලපුව හා මඩකලපුව

තුඩුව - මුහුද දෙසට නෙරාගිය ප්‍රතිරෝධක පාෂාණ සහිත ගොඩබිම් ප්‍රදේශයක් තුඩුව ලෙස හැඳින්වේ.

නිදසුන්:- දෙවුන්දර තුඩුව,
ෆවුල් තුඩුව
සංගමන්කන්ද තුඩුව
පේදුරු තුඩුව

දූපත් - සම්පූර්ණයෙන් ම ජලයෙන් වට වූ කුඩා ගොඩබිම් ප්‍රදේශ දූපත් වේ.

නිදසුන්:-මන්නාරම
ඩෙල්ෆ්ට්
නයිනතිව්
කයිට්ස්

වෙරළ දඹ - වෙරළ ආශ්‍රිත ව ඇති ප්‍රතිරෝධක පාෂාණවලින් සමන්විත ප්‍රපාතාකාර බෑවුම් ප්‍රදේශ දඹ ලෙස හැඳින්වේ.

නිදසුන්:- ත්‍රිකුණාමලය
කිරින්ද
රූමස්සල

ඩෙල්ටා - ගංමෝය ප්‍රදේශයේ දී ගංගාව අතු ගංගාවලට බෙදෙමින් නිර්මාණය වන ත්‍රිකෝණාකර හැඩයෙන් යුතු බිම් කොටස ඩෙල්ටාව නම් වේ.

ගංගාව ඔස්සේ ගලා බසින රොන් මඩ ආදීය මෙම ඩෙල්ටාවේ තැම්පත් වේ.

නිදසුන්:- මහවැලි ගඟ, මී ඔය, කලා ඔය වැනි ගංගාවල ඩෙල්ටා දැකිය හැකි ය.

02. <u>අභ්‍යන්තර තැනිතලාව</u>

❖ මීටර් 30 සිට 300 දක්වා උස සමෝච්ච රේඛාව දක්වා විහිදෙන ප්‍රදේශයයි.

❖ උතුරේ දී පළල් ව විහිදෙන අතර දකුණේ දී පටු ව විහිදේ.

❖ අභ්‍යන්තර තැනිතලාවේ කැපී පෙනෙන භූ ලක්ෂණ

- සමාන්තර හෙල්වැටි
- ශේෂ කඳු
- ගංගා
- පිටාර තැනි
- තැනිතලා

සමාන්තර හෙල්වැටි

වයඹ ගිනිකොන දිශානුගත ව විහිදෙන රක්වාන කඳු හා බුලුතොට හෙල් මේ සඳහා උදාහරණවේ

ශේෂ කඳු - ඛාදනයට ලක් ව ඉතිරි වී ඇති තද පාෂාණ කුට්ටි ශේෂ කඳු වේ.
නිදසුන්:- කතරගම, මිහින්තලය, සීගිරිය, රිටිගල, ගෝවින්ද හෙල



03. මධ්‍යම කඳුකරය

- ❖ මීටර් 300ට වඩා උසින් යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.
- ❖ අනෙක් කලාපවලට වඩා මධ්‍යම කඳුකරය සංකීර්ණ ලක්ෂණවලින් යුක්ත ය.

කඳු පන්ති - මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම් හා උන්නතාංශයකින් යුත් හූ රූප කඳු පන්ති වේ.

1. සමනල කඳු
2. නමුණුකුල කඳු
3. පිදුරුතලාගල කිරිගල්පොත්ත කඳු
4. නකල්ස් කඳු



2.2 සිතියම - මධ්‍යම කඳුකරය

සානු - උස් බිමක පිහිටි සමතලා භූමි සානු ලෙස හැඳින්වේ.

- මහනුවර සානුව
- මහවලතැන්න සානුව
- හැටන් සානුව
- කොස්ලන්ද සානුව
- වැලිමඩ සානුව





කපොලු - කඳු අතර පිහිටි පහත් බිම් කපොලු ලෙස හැඳින්වේ.

- හපුතලේ
- බලන
- ගලගෙදර
- ගිනිගත්හේන

දිය ඇලි - මධ්‍යම කඳුකරයේ සානු විවිධ උසකින් යුක්ත වන අතර ඒ හරහා ගලන ගංගා මොහොර බෑවුම් ඔස්සේ දිය ඇලි සාදමින් ගලා යයි.

- බඹරකන්ද
- දියලුම
- දුන්හිඳ
- රම්බොඩ
- ලක්ෂපාන

<u>ජලවහනය</u>

- ❖ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා නිම්න 103ක් ඇත.
- ❖ මෙම ගංගාවලින් 34ක් ම මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වේ.
- ❖ මෙම ගංගා අවුරුද්දේ සෑම කාලයක ම ජලයෙන් පෝෂණය වන බැවින් **නිත්‍ය ගංගා (බහු වාර්ෂික ගංගා)** ලෙස හැඳින්වේ.
- ❖ වියළි කලාපයේ රැලි බිම්වලින් ආරම්භ වන සමහර ගංගා වර්ෂා කාලයේ දී ගලායන අතර වියළි කාලයේ දී සිඳීයයි. ඒවා **සෘතුමය ගංගා** නමින් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා කිහිපයක තොරතුරු

ප්‍රධාන ගංගාව	දිග (කිලෝමීටර්)	පෝෂක ප්‍රදේශය (වර්ග කිලෝමීටර්)
මහවැලි	335	10327
මල්වතු ඔය	164	3246
කලා ඔය	148	2772
කැලණි	145	2278
යාංඔය	142	1520
දැදුරු ඔය	142	2616
වලවේ ගඟ	138	2442
මාදුරු ඔය	135	1541
මහ ඔය	129	1510
කළු ගංගාව	129	2688

- ■ ශ්‍රී ලංකාවේ ගංගාවලින් 80%ක් ම වියළි කලාපය හරහා ගලා බසී.
- ■ දිග ම ගඟ මහවැලි ගඟ වන අතර එය විශාලතම ගංගා ද්‍රෝණිය ද වේ.
- ■ ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 1/6ක් පමණ මහවැලි ගංගා ද්‍රෝණියට අයත් වේ.

2.3 සිතියම - ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා

➢ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා 103න් 34ක් ම මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වී විවිධ දිශාවන්ට අරීය ජලවහන රටාවකට අනුව ගලා බසී.



අරීය ජලවහන රටාව

➢ එහෙත් ගංගාවලට අතු ගංගා එක් වීමේ දී විවිධ ජලවහන රටා නිර්මාණය වේ.
ඒ අතර ශාඛීය හා ජාලාකාර ජලවහන රටා ප්‍රධාන වේ.



ශාඛීය ජලවහන රටාව



ජාලාකාර ජලවහන රටාව

➢ මහවැලි ගඟ හා සසඳන විට කළු ගඟ, කැලණි ගඟ, ගිං ගඟ වැනි ගංගා ගලායන දුර කෙටි වන අතර ඒවායේ පෝෂක ප්‍රදේශ ද කුඩා වේ.
➢ වර්ෂා කාලවල දී මෙම ගංගා ආශ්‍රිත ව ජල ගැලීම් බහුල ව සිදු වේ.

<u>දේශගුණය</u>

කාලගුණය යනු කිසියම් ස්ථානයක කෙටි කාලයක් තුළ එම ස්ථානය ආශ්‍රිත ව පවතින වායුගෝලීය තත්වය යි.

දේශගුණය යනු කිසියම් ප්‍රදේශයක කාලගුණික තත්වයන් දීර්ඝ කාලයක් තිස්සේ නිරීක්ෂණය කිරීමෙන් නිගමනය කෙරෙන වායුගෝලීය සාමාන්‍ය තත්වය යි.

❖ ශ්‍රී ලංකාව සමකාසන්න ව පිහිටි දූපතක් නිසා වර්ෂය පුරා පවතින අධික **උෂ්ණත්වය** හා වර්ෂය පුරා පවතින **වර්ෂාපතනය** ලංකා දේශගුණයේ කැපී පෙනෙන ලක්ෂණ වේ.

<u>උෂ්ණත්වය</u>

- වර්ෂය පුරා ම ඒකාකාරී උෂ්ණත්වයක් පවතී.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27^0C ක් පමණ වේ.



2.4 සිතියම - ශ්‍රී ලංකාවේ වාර්ෂික උෂ්ණත්ව ව්‍යාප්තිය

උෂ්ණත්වයේ ප්‍රදේශීය වෙනස්කම් වලට බලපාන සාධක කිහිපයකි.

- **ඉන්දියානු උපමහාද්වීපයට ආසන්න ව පිහිටීම**

ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය අධික වීමට හේතු වී ඇත්තේ ඉන්දියාවේ උෂ්ණත්වය වැඩි වන විට එහි බලපෑමට මන්නාරම, යාපනය, අනුරාධපුරය වැනි ප්‍රදේශ ලක් වීමයි.

- **උන්නතාංශය (භූමියේ උස)**

මහනුවර, නුවරඑළිය, ශ්‍රී පාදස්ථානය වැනි ස්ථානවල උෂ්ණත්වය අඩු වීමට හේතුව, භූමියේ උස අනුව උෂ්ණත්වය අඩු වීමයි.

  - භූමියේ උස අනුව උෂ්ණත්වය අඩු වීම **පතන ශීඝ්‍රතාව** ලෙස හැඳින්වේ.

නගරය	මුහුදු මට්ටමේ සිට උස (මීටර)	මධ්‍ය උෂ්ණත්වය ^0C
කොළඹ	0	26.9
මහනුවර	447	24.4
තලවකැලේ	1375	18.6
නුවරඑළිය	1882	15.4
පිදුරුතලාගල	2524	11.5

- **මුහුදේ සිට ඇති දුර**

ශ්‍රී ලංකාව සමකාසන්න රටක් වීම නිසා උෂ්ණත්වය අධික වුව ද දිවයින වටා විශාල සාගරයක් ඇති බැවින් උෂ්ණත්වය අඩු වේ. එහෙත් රට අභ්‍යන්තර තැනිතලා ප්‍රදේශවලට සාගරයේ බලපෑම අඩු වන බැවින් ඉහළ උෂ්ණත්වයක් පවතී.

- **වෙනස් වන සුළං රටාව**

ඍතුමය සුළං එනම්, ඍතු අනුව හමන මෝසම් සුළං හා වාසුළි බලපෑම් හේතු කොටගෙන උෂ්ණත්වය සමනය වේ.

වර්ෂාපතනය

❖ වර්ෂාපතනය යනු, කිසියම් කාලයක් තුළ දී ප්‍රදේශයකට ලැබෙන මුළු වැසි ප්‍රමාණය වේ.

➢ වර්ෂාපතන ව්‍යාප්තිය ප්‍රාදේශීය ව වෙනස් වේ.
ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර සහ ගිනිකොන ප්‍රදේශවල අඩු වර්ෂාපතනයක් ද මධ්‍යම කඳුකර ප්‍රදේශයේ වැඩි වර්ෂාපතනයක් ද දැකගත හැකි ය.



2.5 සිතියම - ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය

❖ ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම තුනකි.

01. සංවහන වර්ෂාව

02. මෝසම් වර්ෂාව

03. වාසුළි වර්ෂාව

01. **<u>සංවහන වර්ෂාව</u>**

ශ්‍රී ලංකාව සමකාසන්න ව පිහිටා තිබීම නිසා අවුරුද්ද මුළුල්ලේ ම සංවහන ක්‍රියාවලියේ බලපෑමට ලක් වේ.

ශ්‍රී ලංකාවේ සංවහන වර්ෂාව ලැබෙන කාලසීමාව

01. පළමු අන්තර් මෝසම් කාලය - මාර්තු, අප්‍රේල් මාසවල ක්‍රියාත්මක වේ.

02. දෙවන අන්තර් මෝසම් කාලය - ඔක්තෝබර්, නොවැම්බර් මාසවල ක්‍රියාත්මක වේ.

- ශ්‍රී ලංකාව සමකය ආසන්නයේ පිහිටා තිබීම නිසා අවුරුද්ද මුළුල්ලේ ම අධික සූර්යතාපයක් ලැබේ.

- අප්‍රේල් සහ සැප්තැම්බර් යන මාසවල ශ්‍රී ලංකාවට හිරු මුදුන් වන බැවින් පොළෝතලය ආසන්නයේ වායුව රත් වී ඉහළ නගී.

- ඒවා සංවහන වායු ධාරා ලෙස හැඳින්වේ.

- ඉහළ ගිය වායුව සිසිල් වී එහි ඇති ජලවාෂ්ප ඝනීභවනය වී වලාකුළු සෑදීමෙන් වර්ෂාව හටගනී.

- මෙම වර්ෂාව සවස් කාලයේ ලැබීම විශේෂ ලක්ෂණයකි.

- උදය වරුවේ පැහැදිලි අහස හා සූර්යාලෝකය ලැබෙන අතර දහවල අහස වලාකුළු වලින් බර වී සවස් කල වැසි ලැබීම සිදු වේ.

මේවා අසනි වැසි, සවස් කල වැසි, අකුණු කුණාටු වැසි ලෙස ද හැඳින්වේ.

02. **<u>මෝසම් වර්ෂාව</u>**

මෝසම් සුළං අවුරුද්දේ නිශ්චිත කාලයක දී ගොඩබිම හරහා හමන සුළං විශේෂයකි.

කාලයකට පමණක් හමන යන අර්ථයෙන් මෝසම් ලෙස නම් කෙරේ.

ශ්‍රී ලංකාවට මෝසම් වර්ෂාව ලැබෙන කාල වකවානු දෙකකි.

1. නිරිතදිග මෝසම් වර්ෂාව (මැයි සිට සැප්තැම්බර් දක්වා)

2. ඊසානදිග මෝසම් වර්ෂාව (දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා)

නිරිතදිග මෝසම් වර්ෂාව

- වැඩි ජල වාෂ්ප ප්‍රමාණයක් රැගෙන ඉන්දියන් සාගරය හරහා එන සුලග නිරිත දෙසින් ලංකාවට ඇතුල් වේ.

- ජල වාෂ්ප සහිත සුළං මධ්‍යම කඳුකරයේ ගැටී ඉහළ ගොස් ශ්‍රී ලංකාවේ නිරිත හා බටහිර ප්‍රදේශවලට අධික වර්ෂාවක් ලබා දේ.

- මධ්‍යම කඳුකරයේ සුළං මුවාවේ පිහිටි නැගෙනහිර ප්‍රදේශවලට ද ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශ වලට ද මෙමගින් අධික වැසි නොලැබේ.

- එය වියළි සුළගක් ලෙස එම ප්‍රදේශ හරහා හමා යාම ඊට හේතුවයි.

- මෙම වියළි සුළග මඩකලපුව ප්‍රදේශයේ දී 'කච්චාන්' නමින් හැඳින්වේ.



2.6 සිතියම - නිරිතදිග මෝසම් වර්ෂාව

ඊසානදිග මෝසම් වර්ෂාව

- ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් හමා එන නිසා මෙය ඊසානදිග මෝසම ලෙස හඳුන්වයි.
- ඉන්දියාවේ සිට බෙංගාල බොක්ක වැනි කුඩා ජලතල ප්‍රදේශයක් හරහා හමා එන සුළඟක් බැවින් අඩංගු ජලවාෂ්ප ප්‍රමාණය අඩු ය.
- එබැවින් නිරිතදිග මෝසම්වලින් මෙන් වැඩි වැසි නොලැබේ.
- ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට වැඩි වර්ෂාවක් ලැබේ.



2.7 සිතියම - ඊසානදිග මෝසම් වර්ෂාව

03. <u>**වාසුළි වර්ෂාව**</u>

- ශ්‍රී ලංකාවට බලපාන වාසුළි වැඩි වශයෙන් ඇති වන්නේ බෙංගාල බොක්ක ප්‍රදේශයේ ය.
- අවුරුද්දේ ඕනෑ ම කාලයක වාසුළි ක්‍රියාත්මක විය හැකි නමුත් වාසුළි ප්‍රබල ව ක්‍රියාත්මක වන්නේ නොවැම්බර් දෙසැම්බර් මාසවල දී ය.
- වාසුලිවලින් වැඩි වැසි ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට ය.
- ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළින් රට තුළට පිවිසෙන වාසුළි වයඹදිග වෙරළින් පිට ව යයි.
- වාසුළි බලපෑම් ඇති වන බොහෝ අවස්ථාවල දී ශ්‍රී ලංකාව පුරා ම විශාල ප්‍රදේශයකට එමගින් වැසි ලැබේ.
- මෝසම් සුළං ක්‍රියාත්මක වන කාලවල දී ද වාසුලිවල බලපෑම ක්‍රියාත්මක විය හැකි ය.
- එවැනි අවස්ථාවල දී අධික වර්ෂාපතනයක් ලැබෙන අතර ජල ගැලීම් ද ඇති වේ.
- සුළගේ තීව්‍රතාව අනුව වායු කැලඹීම්, අවපාත, සුළි කුණාටු ආදි නම්වලින් ද මෙම සුළං හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප

සමාන දේශගුණික ලක්ෂණ පවතින ප්‍රදේශයක්, දේශගුණික කලාපයක් ලෙස හඳුනාගත හැකි ය.

උෂ්ණත්වය, වර්ෂාපතනය වැනි සාධක අනුව ශ්‍රී ලංකාව දේශගුණික කලාප පහකට බෙදා ඇත.

1. **පහතරට තෙත් කලාපය**
2. **පහතරට වියළි කලාපය**
3. **කඳුරට තෙත් කලාපය**
4. **කඳුරට වියළි කලාපය**
5. **අර්ධ ශුෂ්ක කලාපය**



2.8 සිතියම - ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප

පහතරට තෙත් කලාපය

- ශ්‍රී ලංකාවේ නිරිතදිග තැනිතලා ප්‍රදේශය මෙයට අයත් ය.
- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 2000mmට වැඩි වේ.
- සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27^0C පමණ වේ.
- මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිතදිග මෝසම් කාලය ප්‍රධාන වැසි සෘතුව වුව ද සාමාන්‍යයෙන් අවුරුද්ද මුළුල්ලේ ම වර්ෂාව පැවතිය හැකි ය.
- පෙබරවාරි සහ අගෝස්තු මාස තරමක් වියළි වුව ද මෙම කලාපයේ සාමාන්‍යයෙන් වියළි සෘතුවක් නොමැති තරම් ය.

පහතරට වියළි කලාපය

- ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර තැනිතලා ප්‍රදේශ මෙයට අයත් වේ.
- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 1250mm-2000mm අතර වේ.
- තෙත් හා වියළි කාලයක් පවතී.
- දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ඊසානදිග මෝසමෙන් හා වාසුළි මගින් ද වැසි ලැබේ.
- සමහර කාලවල දී වර්ෂාව අවිනිශ්චිත ය.
- අධික වාෂ්පීකරණයක් ද පවතී.

කඳුරට තෙත් කලාපය

- මාතලේ, මහනුවර, නුවරඑළිය හපුතලේ නගර සම්බන්ධ කරන රේඛාවකින් වෙන් වුණ මධ්‍යම කඳුකරයේ බටහිර අර්ධය මීට අයත් වේ.
- මෙම කලාපයට අවුරුද්ද පුරා වැසි ලැබේ.
- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 3000mm පමණ වේ.
- ශ්‍රී ලංකාවේ වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන මාලිබොඩ, වටවල, කෙනිල්වර්ත් වැනි ස්ථාන මෙම කලාපයේ පිහිටා ඇත.
- දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා වියළි සුළං පවතී.

කඳුරට වියළි කලාපය

- කඳුරට තෙත් ප්‍රදේශයේ නැගෙනහිර අර්ධය මෙයට අයත් වේ.
- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 1750mm-2000mm අතර වේ.
- ඊසානදිග මෝසමෙන් වැඩි වර්ෂාවක් ලැබෙන අතර සුළං මුවාවේ පිහිටීම නිසා නිරිතදිග මෝසමෙන් වැසි නොලැබේ.
- අවුරුද්දේ වැඩි කාලයක් වියළි සුළඟක් පවතී.

<u>අර්ධ ශුෂ්ක කලාපය</u>

- ශ්‍රී ලංකාවේ වයඹ දිග පිහිටි මන්නාරම හා ඒ අවට ප්‍රදේශ, ගිනිකොන ප්‍රදේශයේ පිහිටි හම්බන්තොට ආදි ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.
- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 650mm-1250mm අතර වේ.
- වර්ෂාපතනය මාස 3-4කට සීමා වේ.
- සංවහන වැසි ක්‍රියාත්මක වේ.
- වාෂ්පීකරණය අධික ය.